# සංස්කෘතිය වෙනස්වීම

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රධාන ලක්‍ෂණයක් වනුයේ ඉන්ද්‍රිය පිනවීමට හැකි සෑම ඉඩකඩක් ම ලබාදීම ය. මිනිස් සිරුර හා මනස ඉල්ලා සිටින්නේ ඉන්ද්‍රිය පිනවීම මිස ඉන්ද්‍රිය පාලනය නො වෙයි. ඉන්ද්‍රිය පාලනය යනුවෙන් හැඳින්වෙන්නේ ඉන්ද්‍රිය තැවීම නොවන බව ද පැහැදිලි වියයුතු ය. ඉන්ද්‍රිය තැවීම මෙන් ම ඉන්ද්‍රිය පිනවීම ද සිංහල බෞද්ධයෝ  සංස්කෘතිය ආධාරකරගනිමින් ප්‍රතික්‍ෂේප කරති. ඒ නීත්‍යානුකූල යටවීමක් නිසා සිදුවන්නක් නො වෙයි. සංස්කෘතික බැඳීමක් හා නීත්‍යානුකූල යටවීමක් අතර වැදගත් වෙනසක් ඇත.

සංස්කෘතිය යනු සමූහයක් විසින් තනා ගැනෙන්නකි. යමක් සංස්කෘතියක පිළිගැනීම යනු සමස්තයක් වශයෙන් ගත්කල  ඒ සංස්කෘතියෙහි වාසයකරන ජනයා විසින් එය පිළිගනු ලැබීමකි. ඒ පිළිගැනීමට විරුද්ධවන්නන්ට අවශ්‍ය නම් සංස්කෘතියෙහි යම් කිසි අංගයකට විරුද්ධවිය හැකිවා පමණක් නොව තමන් එයට විරුද්ධව පිළිගන්නා සංස්කෘතිකාංගයක් අනුව ජීවත්වීමට ද හැකි ය. ඇතැම් සංස්කෘතියක එසේ කිරීමට ඇති නිදහස අඩු බව ද මෙහි දී අමතක නොකළ යුතු ය. එහෙත් නීතිය එසේ නො වෙයි. යමකුට නීතිපොතෙහි  ඇති නීතියකට පටහැණිව ජීවත්විය නො හැකිය. එසේ නීතියට පටහැණිව ගියහොත් දඬුවම්දීම සඳහා ක්‍රමයක් නීතියෙන් ම සම්පාදනය වී ඇත.

යම් නීතියක් ඇතිවන්නේ  සංස්කෘතියක වුව ද සංස්කෘතියට නැති ආකාරයකින් දඬුවම් දීමේ හැකියාව නීතියට ඇති බැවින් සමාජයක් ලෙස ගත්කල නීතියේ සමජාතීය බවක් පෙනේනට ඇත. ඒ එසේ වුවත් සංස්කෘතියකින් තොරව නීතියක් නොමැති බවත් නීති පද්ධතියක පැවැත්ම අනිවාර්ය නොවන බවත් වටහාගත යුතු වෙයි. නීති පද්ධතියක් නැති සංස්කෘතීන් ද තිබිය හැකි ය. අඩුම තරමින් ලෝක ඉතිහාසයෙහි එවැනි සංස්කෘතීන් තිබෙන්නට ඇත. නීති පද්ධතියක් වුව ද සමාජයට, අඩුම තරමින් සමාජයෙහි බලය දරන්නන්ට අවශ්‍ය ආකාරයට වෙනස්කරගන්නා බව ද අමතක නොකළ යුතු ය.

අපට අවශ්‍ය වන්නේ බටහිරයන් පැමිණීමෙන් පසු මෙරට සංස්කෘතිය වෙනස්වීම පිළිබඳ දළ වැටහීමක් ලබාගැනීමට ය. බටහිරයන් පැමිණීමට පෙර මෙරට පැවතියේ සිංහල බෞද්ධ සංස්කෘතියකි. මෙහි දී ඇතැම් පඬියන් එකල ද මෙරට බහුසංස්කෘතික සමාජයක් වූ බවට ඓතිහාසික සාධක ඇතැයි කියනු ඇත. එකල ද වෙනත් සංස්කෘතීන්ට අයත් කිහිප දෙනකු මෙරට සිටින්නට ඇත. එසේත් නැත්නම් වෙළෙඳාමට පැමිණි ඇතැමුන් විවිධ සංස්කෘතීන්ට අයත්වන්නට ඇත. එලෙස වෙනත් සංස්කෘතියකට අයත් කිසිවකු මෙරට නොසිටියේ යැයි කියන්නකු මට නම් තවම මුනගැසී නැත.

එහෙත් එකල මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියක් පැවතියේ යැයි අප කියන්නේ වෙනත් සංස්කෘතියකට අයත්වූවකු මෙරට නොසිටියේ ය යන අර්ථයකින් නොව, එකල ප්‍රධාන සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය වීය යන තේරුමෙන් ය. අද එංගලන්තයේ හෝ ඇමරිකාවේ සංස්කෘතිය ඇංග්ලිකන් ක්‍රිස්තියානි හෝ එහි ඇමරිකන් ප්‍රභේදය හෝ වෙයි. ඒ රටවල ප්‍රධාන නොව අධිපති සංස්කෘතීන් පිළිවෙළින් ඒ සංස්කෘතීන් වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ රටවල වෙනත් සංස්කෘතීන් නැති බවක් නො වෙයි. ඒ එසේ වුවත් ඒ රටවල උගතුන් හා මෙරට සිටින අනුකාරකයන් බහු සංස්කෘතික රටක් යන්න ලංකාවට යොදන්නේ ඒ අර්ථයෙන් නොව මෙරට සියළු සංස්කෘතීන් සමාන වෙය යන අර්ථයෙනි.

බටහිරයන් පැමිණෙන විට මෙරට ප්‍රධාන සංස්කෘතිය සිංහල බෞද්ධ විය. සිංහල බෞද්ධ සංස්කෘතිය සාමූහිකත්වය මත පදනම් වූ සංස්කෘතියක් වෙයි. එහි සාමූහිකත්වය මිනිසුන් අතර වූ සාමූහිකත්වයකට පමණක් සීමා නොවෙයි. ඒ සාමූහිකත්වය සත්වයන් හා වෘක්‍ෂලතා ආදියද එකතුකරගත් එකක් විය. සමාජයීය පෞද්ගලිකත්වය ඒ සංස්කෘතියෙහි ඉස්මතු නො වීය. එමෙන් ම එහි ලෞකික වශයෙන් ගත්කල ඉන්ද්‍රිය පිනවීම මෙන් ම ඉන්ද්‍රිය තැවීම ද ප්‍රතික්‍ෂේප විය. එහෙත් එවැනි සංස්කෘතියක් පවත්වාගෙන යෑම පහසු කරුණක් නො වෙයි. පුදුමය සිංහල බෞද්ධ සංස්කෘතිය මෙතරම් කලක් නොනැසී පවත්වාගෙන යනු ලැබීම ය.

© Prof. Nalin De Silva

මිනිසුන්ගේ සිරුරු හා මනස් නිර්මාණය වී ඇති ආකාරයට අනුව ඉන්ද්‍රිය පිනවීම යන්න ජෛවීය වශයෙන් ගත්කල ස්වාභාවික වෙයි. කුඩා දරුවකුට පැණිරස කෑමට අමුතුවෙන් පුරුදු කළයුතු නො වේ. එහෙත් කුඩා ළමයකුට කරවිල කෑමට පුරුදු කළයුතු ය. කරවිල සෞඛ්‍යයට හිතකරවීම හා පැණිරස අහිතකර බව දරුවාට කියා දුන්නත් දරුවාගේ කැමැත්ත ඇත්තේ පැණිරසට ය. සිරුරට හිතකර වුවත් දරුවන්ට කරවිල සඳහා නිසග කැමැත්තක් නො මැත. අමාරුවෙන් හෝ කරවිල ද කෑමට ඉගැන්වුවත් කුඩා දරුවාගේ කැමැත්ත පැණිරස කෑමට ය.

සිංහල බෞද්ධ සංස්කෘතිය පැණි රස මුළුමනින් ම ප්‍රතික්ෂේප නොකළ එහෙත් කරවිල කෑමට ද ජනතාව පුහුණුකළ, සංස්කෘතියකි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි එකම ලක්ෂණය මෙය යැයි වරදවා තේරුම්ගතයුතු නො වේ. මෙහි දී අප කරන්නේ උදාහරණයකින් යම් කරුණක් පැහැදිලිකිරීම පමණ ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඉන්ද්‍රිය පිනවීමක් හෝ තැවීමක් නැත යනුවෙන් කියැවෙන්නේ මේ කරුණ ය.

මෙහි දී වැදගත් වන අනෙක් කරුණ නම් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දැඩි නීති පද්ධතියක් නො වීම ය. ඉන්ද්‍රිය පිනවීම තහනම්කිරීමක් ඒ සංස්කෘතියෙහි දැකගත නො හැකි ය. මිනිසුන් යම් යම් දේ නොකර සිටියේ ද, අද නොකරන්නේ ද ස්වේච්ඡාවෙනි. සිංහල බෞද්ධයන් ද ඇතුළු ථෙරවාදී බෞද්ධයන් පන්සිල් ගන්නේ ද ස්වේච්ඡාවෙනි. පන්සිල් රකින්නේ ද ස්වේච්ඡාවෙනි. එපමණක් නොව පන්සිල්හි කිසිවක් තහනම්කර ද නැත. සිංහල බෞද්ධයෝ පණ ඇති සතුන් මැරීමෙන් වළකිමු යැයි කියති. ඔවුන්ට පණ ඇති සතුන් මැරීම තහනම්කර නැත.

එවැනි සංස්කෘතියක් ඇති ජනතාවකට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලැබුණු විට කුමක් සිදුවේ ද? (පෘතුගීසීන් ආගමින් කතෝලික වුව ද සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානි බව අවධාරණය කළයුතු ය.) අප කලින් සඳහන්කර ඇති පරිදි එක් පැත්තකින් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ඒ සංස්කෘතිය ප්‍රචලිතකිරීමේ අවශ්‍යතාව වෙයි. එහි දී බටහිරයෝ කෲර විධික්‍රම ද අනුගමනයකරති. මෙරටට පැමිණි පෘතුගීසීන් අනුගමනයකළ කෲර ක්‍රමවේද ගැන අමුතුවෙන් සඳහන් කළයුතු නො වෙයි.

හින්දු සංස්කෘතියෙහි හෝ මුස්ලිම් සංස්කෘතියෙහි මෙන් දැඩි විනය සංග්‍රහයක් නොමැති සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ආගම වෙනස්කළ අය ප්‍රතිශතයක් ලෙස ගත්කල අඩු ය. එයට එක් හේතුවක් වන්නට ඇත්තේ ආගමක් ලෙස ගත්කල සිංහල බුද්ධාගමෙහි ඇති නිදහස ය. එසේ වුව ද අනෙක් පැත්තෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය දැඩි නොවීම හේතුකොටගෙන ඒ සංස්කෘතිය වෙනස්වීමට පටන්ගැනීම බලාපොරොත්තුවිය යුතු ය. ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනකොටස් තුන බටහිර නූතනත්ව ආක්‍රමණය ඉදිරියෙහි ක්‍රියාකර ඇති අන්දම පරීක්ෂාකිරීමෙන් මෙය තවදුරටත් වටහාගත හැකි ය.

බටහිරයන්ගේ පැමිණීමෙන් පසුව ප්‍රතිශතයක් ලෙස ගත්කල වැඩි පිරිසක් දෙමළ හින්දු සංස්කෘතියෙහි ජනතාව කතෝලික හෝ ක්‍රිස්තියානි හෝ වූහ. එහෙත් හින්දු සංස්කෘතියෙන් බැහැර නොවූවෝ ඒ සංස්කෘතිය රැකගැනීමට කටයුතු කළහ. බටහිරයන් පැමිණීමෙන් පසුව මෑතක් වන තෙක් ම දෙමළ හින්දු සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය තරම් වෙනසකට භාජනය නො වී ය. සිංහල බෞද්ධයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස ගත්කල ආගම වෙනස්කර ඇත්තේ අඩු ප්‍රමාණයක් වුව ද ඔවුන් තම සංස්කෘතිය වෙනස්කර ඇත. මෙරට ජනකොටස් අතරින් වඩාත්ම බටහිරකරණයට භාජනය වී ඇත්තේ සිංහල බෞද්ධයන් ය.

ඒ අතර මුස්ලිම් ජනයා ආගමින් හෝ සංස්කෘතියෙන් හෝ වෙනස් වී ඇත්නම් ඒ ඉතා අල්ප වශයෙනි. මුස්ලිම් ආගම මෙන් ම සංස්කෘතිය ද ඉතා දැඩි නීතී රීති පද්ධතියකට යටත්වෙයි. එවැනි තත්වයක් යටතෙහි මුස්ලිම් ජනයාට වෙනස්වීමට ඇති ඉඩකඩ ඉතා අල්ප ය. මුස්ලිම් ජනයා අතර බටහිරකරණයට ගොදුරුවූවන් වික දෙනකු සිටිය ද ඉතා වැඩි පිරිසක් ලෝකයේ සෑම තැනකම පාහේ තම ආගම හා සංස්කෘතිය දැඩිව ආරක්ෂාකරති.

එසේ වුවත් සංස්කෘතිය රැකීම පිළිබඳ දේශාරෝපණයට ලක්වන්නේ ද සිංහල බෞද්ධයන් ය. තම සංස්කෘතිය වැඩියෙන් ම වෙනස්කරගත් කොටස එසේ දේශාරෝපණයට ලක්වන්නේ කෙසේ ද? මුස්ලිම් සංස්කෘතිය රැකීම පිළිබඳව ලංකාවේ කිසිවකු දොස් නොකියන්නේ ඇයි? යම් සංස්කෘතියක් විවේචනයකිරීම එක්කෝ ඒ සංස්කෘතියට ම

අයත්වූවන් අතින් නැතහොත් වෙනත් සංස්කෘතියකට අයත්වූවන් අතින් සිදුවිය යුතු ය. ලංකාවේ මුස්ලිම් සංස්කෘතිය විවේචනයට ලක්කිරීමට කිසිවෙක් ඉදිරිපත් නො වෙති.

සමස්තයක් ලෙස ගත්කල ලංකාවේ මුස්ලිම් ජනයා තම සංස්කෘතිය විවේචනය නො කරති. ඒ වෙනුවට ලංකාවේ මුස්ලිම් ජනයා තම අනන්‍යතාව ප්‍රකාශකිරීම සඳහා ඉදිරියට පැමිණෙති. එහි දී සමස්තයක් ලෙස ගත්කල සිංහල බෞද්ධයන්ගෙන් විවේචනයක් එල්ල නො වෙයි. එයට හේතුව සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මුල සිට ම දක්නට ලැබෙන අන්‍ය සංස්කෘතීන් හා ආගම් ඉවසීම ය. හින්දු සංස්කෘතිය සම්බන්ධයෙන් ද එපමණට නොවූවත් ආරක්ෂණවාදී හා ආක්‍රමණශීලී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙයි.

එහෙත් සිංහල බෞද්ධ සංස්කෘතිය සම්බන්ධයෙන් ගත්කල ඒ සංස්කෘතියෙහි සිටින්නේ යැයි කියන්නෝ ද වෙනත් සංස්කෘතීන්හි ජීවත්වන්නෝ ද ඒ විවේචනයකිරීමට ඉතා නොබියව ඉදිරියට පැමිණෙති. සංස්කෘතියක් රැකිය නොහැකිය එය වෙනස්වන්නේ යැයි කියන පඬියන් මෙන් ම සිංහලයන් අනෙක් සංස්කෘතීන් පාගා දමන්නේ යැයි ද, අනෙක් සංස්කෘතීන් නොඉවසන්නේ යැයි ද කියන ඊනියා මානව හිතවාදීන් ද අපට මෙහි දී දැකගත හැකි ය. එයට හේතු දෙකක් වෙයි. එක් පැත්තකින් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති නිදහස ම එහි දී ප්‍රයෝජනයට ගැනෙයි. සිංහලයන්ට තම සංස්කෘතිය විවේචනයකිරීමට වෙනත් සංස්කෘතියක අයකුට තම සංස්කෘතිය විවේචනයකිරීමට ඇති නිදහසට වැඩි නිදහසක් ඇත. අනෙක් පැත්තෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ථෙරවාද බෞද්ධ සංස්කෘතිය හැකිනම් මිහිතලයෙන් අතුගා දැමීමේ අවශ්‍යතාව වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva